# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1925/37 - 2015 ජූලි මස 28 වැනි අඟහරුවාදා - 2015.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1070/13 දරන හා 1999.03.11 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ටී. එම්. එල්. සී. සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2015 ජූලි මස 13 වන දින,
කොළඹ දී ය.

1. **ක්‍රියාත්මක වන දිනය :**

   මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2015.07.28 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. **පත් කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව

3. **සේවා ගණය/සේවා ගණ :**

   **3.1 සේවා ගණය :** විධායක

   **3.2 ශ්‍රේණි :** III ශ්‍රේණිය
   II ශ්‍රේණිය
   I ශ්‍රේණිය

1A - PG 2566 — 210 (2015/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. **පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :** ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අදාළව පාසල්වල ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ගුරුවරුන්ට අවශ්‍ය වන දැනුම කුසලතා හා ආකල්ප අත්පත් කර ගැනීමේ කාර්ය සඳහා පිහිටුවා ඇති ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල අධ්‍යයන කාර්යයන් හා ඊට අනුශාංගික වන්නා වූ කාර්යයන් ඉටු කිරීම. එසේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස් වන දැනුම ලබා ගැනීම සඳහා උසස් අධ්‍යාපන ආයතන සමග සමීප සම්බන්ධතාවයකින් කටයුතු කිරීම.

5. **වැටුප් :**

**5.1 වැටුප් කේත අංකය :** - SL - 1 - 2006

**5.2 වැටුප් පරිමාණය :** රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - 53,555/-

**5.3 සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :**

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය* |
|---|---|---|
| III | පියවර 01 | රු.22,935 |
| II | පියවර 12 | රු.30,175 |
| I | පියවර 20 | රු. 36,755 |

6. **සේවයට අයත් තනතුරු :**

**6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ශ්‍රේණි :**

| *අනුමත තනතුරු නාම* | *ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|
| අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති | I | 18 |
| අධ්‍යාපන විද්‍යාපීඨ උප පීඨාධිපති | I | 59 |
| ගුරු විද්‍යාල විදුහල්පති | I | 8 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | I | 37 |
| සම්බන්ධීකරණ කථිකාචාර්ය | I | 60 |
| ගුරු විදුහල් නියෝජ්‍ය විදුහල්පති | II / III | 16 |
| ගුරු මධ්‍යස්ථාන කළමණාකරු | II / III | 106 |
| කථිකාචාර්ය | II / III | 1785 |
| **එකතුව** | | **2089** |

**6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 2089**

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැළකේ.

**6.3 තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :** ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

7. **බඳවා ගැනීමේ ක්‍රමය :**

**7.1 බඳවා ගන්නා අනුපාතය :**

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 35% |
| සීමිත | 65% |
| කුසලතා | අදාළ නැත |

**7.2 විවෘත බඳවා ගැනීම :**

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය - III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් අදාළ විෂයය ක්ෂේත්‍රයේ දෙවන පෙළ (ඉහළ) පන්ති සමාර්ථයක් සහිත උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා තිබීම

හෝ

අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යාපනවේදී දෙවන පෙළ (ඉහළ) පන්ති සමාර්ථයක් සහිත උපාධිය ලබා තිබීම

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

(i) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) විවෘත තරඟ විභාගය සඳහා වාර තුන (03) කට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත.

(iii) සුදුසුකම් ලබන දිනය - සේවයට පත් කිරීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු 7.2.2 සිට 7.2.3 ඡේදය දක්වා සඳහන් කර ඇති අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කර ඇති දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : 22

7.2.3.2 උපරිම සීමාව : 30

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

(i) ලිඛිත විභාගයක හා ප්‍රායෝගික පරීක්ෂණයක් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

(ii) එහිදී අපේක්ෂකයකු විසින් ලිඛිත විභාගයේ විෂයයන් තුනටම පෙනී සිට එම විෂයයන් සියල්ලන්ගෙන්ම සමත්ව තිබිය යුතුය.

(iii) ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව හා ඊට ඉහළ ලකුණු ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(iv) ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත පරීක්ෂණයේ දේශන පැවැත්වීමේ ප්‍රායෝගික කුසලතාව යන දෙකෙන්ම අවම සමත් ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සේවයට බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය | 100 | 40 |
| අවබෝධය සහ සිද්ධි අධ්‍යයනය | 100 | 40 |
| අධ්‍යාපන මූලධර්ම | 100 | 40 |

(යොමුව උප ලේඛන IV)

7.2.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අවස්ථාවේදීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු - ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සියල්ල සෑම ආකාරයෙන්ම සපුරා තිබේ දැයි පරීක්ෂා කිරීම.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| I කොටස | | |
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 2. ගුරු වෘත්තියේ ලබා ඇති පළපුරුද්ද | 15 | |
| 3. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 10 | |
| 4. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාවය | 10 | |
| II කොටස - ප්‍රායෝගික පරීක්ෂණය | | |
| 1. දේශන පැවැත්වීමේ ප්‍රායෝගික කුසලතාව | 50 | 20 |

සටහන :

(i) ඉහත වගුවෙහි I කොටසෙහි දක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

(ii) දේශන පැවැත්වීමේ කුසලතාවය පරීක්ෂා කිරීම සඳහා පහත දක්වෙන පරිදි ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. දේශන සටහන් පිළියෙල කිරීම | 25 | 20 |
| 2. ඉදිරිපත් කිරීම | 25 | |
| 2.1 පිවිසුම | 04 | |
| 2.2 දේශන සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම | 04 | |
| 2.3 ඉදිරිපත් කිරීමේ විලාශය | 08 | |
| 2.4 විෂයය අන්තර්ගතය | 05 | |
| 2.5 කාල කළමණාකරණය | 04 | |

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරනු ලබන අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් රජයේ ගැසට් පත්‍රයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය - III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් අදාළ විෂයය ක්ෂේත්‍රයේ උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා තිබීම

හෝ

අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යාපනවේදී උපාධිය ලබා තිබීම.

සටහන 1 - සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර 05 ක් ගතවන තුරු උපලේඛන VII හි දක්වා ඇති විෂයයන් සම්බන්ධයෙන් එහි දක්වා ඇති සුදුසුකම් අවම සුදුසුකම් ලෙස භාර ගනු ලබන අතර පස් අවුරුදු කාල සීමාව අවසානයේ එම තත්ත්වය සමාලෝචනය කරනු ලැබේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද :

7.3.2.3.1 සීමිත :

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට හෝ ඊට පෙර ඉහත 7.3.2 හි සඳහන් සුදුසුකම් සහිත රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත්, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පත්වීම ස්ථිර කර ඇති වසර පහ (05) කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් ඃ

(i) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ තනතුරේ ස්ථිර කර ඇති නිලධරයකු විය යුතු ය.

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සියලු වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

(iv) සීමිත තරග විභාගය සඳහා වාර තුන (03) කට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත.

(v) සුදුසුකම් ලබන දිනය - සේවයට පත් කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු 7.3.2 සිට 7.3.3 ඡේදය දක්වා සඳහන් කර ඇති අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කර ඇති දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

7.3.3 වයස ඃ

7.3.3.1 අවම සීමාව ඃ අදාළ නොවේ

7.3.3.2 උපරිම සීමාව ඃ අවුරුදු 45

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය ඃ

(i) ලිඛිත විභාගයක හා ප්‍රායෝගික පරීක්ෂණයක් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

(ii) එහිදී අපේක්ෂකයකු විසින් ලිඛිත විභාගයේ විෂයයන් තුනටම පෙනී සිට එම විෂයයන් සියල්ලන්ගෙන්ම සමත්ව තිබිය යුතුය.

(iii) ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව හා ඊට ඉහළ ලකුණු ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(iv) ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත පරීක්ෂණයේ දේශන පැවැත්වීමේ ප්‍රායෝගික කුසලතාව යන දෙකෙන්ම අවම සමත් ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සේවයට බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය ඃ

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය | 100 | 40 |
| අවබෝධය සහ සිද්ධි අධ්‍යයනය | 100 | 40 |
| අධ්‍යාපන මූලධර්ම | 100 | 40 |

(යොමුව උප ලේඛන IV)

7.3.4.1.1 පවත්වන බලධරයා ඃ විභාග කොමසාරිස් ජනරාල්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය ඃ අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ඃ ලකුණු ලබා දෙනු නොලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අවස්ථාවේදීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු - ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සියල්ල සෑම ආකාරයෙන්ම සපුරා තිබේ දැයි පරීක්ෂා කිරීම.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා ඃ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඃ

| *ලකුණු ලබා දෙන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| I කොටස | | |
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 2. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 3. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාවය | 15 | |
| II කොටස - ප්‍රායෝගික පරීක්ෂණය | | |
| 1. දේශන පැවැත්වීමේ ප්‍රායෝගික කුසලතාව | 50 | 20 |

සටහන ඃ

(i) ඉහත වගුවෙහි I කොටසෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

(ii) දේශන පැවැත්වීමේ කුසලතාවය පරීක්ෂා කිරීම සඳහා පහත දැක්වෙන පරිදි ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. දේශන සටහන් පිළියෙල කිරීම | 25 | 20 |
| 2. ඉදිරිපත් කිරීම | 25 | |
| 2.1 පිවිසුම | 04 | |
| 2.2 දේශන සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම | 04 | |
| 2.3 ඉදිරිපත් කිරීමේ විලාශය | 08 | |
| 2.4 විෂයය අන්තර්ගතය | 05 | |
| 2.5 කාල කළමණාකරණය | 04 | |

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ අභ්‍යන්තර දැන්වීම් පළකිරීම සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 **කුසලතා පදනම මත බඳවා ගැනීම :** අදාළ නොවේ

8. **කාර්යක්ෂමතා කඩඉම :**

8.1

| *කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත/වෘත්තීය/ සහතික පාඨමාලා/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට පත්වී වසර තුන (03) ක් ගත විමට පෙර | යොමුව : උප ලේඛනය 'III' |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II ශ්‍රේණියට උසස්වීම් ලැබ වසර තුන (03) ක් ගතවීමට පෙර | යොමුව : උප ලේඛනය 'III' |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ වසර පහ (05) ක් ගතවීමට පෙර | යොමුව : උප ලේඛනය 'III' |

**සංලක්ෂය :** අංක 1070/13 හා 1999.03.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව යටතේ 3 පන්තිය සඳහා පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නිලධාරීන් මෙම ව්‍යවස්ථාව යටතේ 2 වන කාර්යක්ෂමතා කඩඉම සමත් ලෙසද, 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නිලධාරීන් මෙම ව්‍යවස්ථාව යටතේ 1 වන කාර්යක්ෂමතා කඩඉම (ඉංග්‍රීසි විෂයය හැර) සමත් ලෙසද පිළිගනු ලැබේ.

8.2 **පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :** වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

8.3 **කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :**

1 වන කාර්යක්ෂමතා කඩඉම : විභාග කොමසාරිස් ජනරාල්.

2 වන කාර්යක්ෂමතා කඩඉම : අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

9. **භාෂා ප්‍රවීණතාවය :**

9.1

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරීන් වසර 03 ක් තුළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | සෑම නිලධාරියකුම සේවයට බඳවා ගෙන වසර පහක් (05) ක් තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 3. සන්ධාන භාෂාව | සේවයට බඳවා ගනු ලැබූ නිලධාරියකු බඳවා ගැනීමේ දින සිට වසර තුන (03) ක් ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. නිලධාරියකු අ.පො.ස. (සා.පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයකින් සමත්ව ඇති නම් සන්ධාන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් උප ලේඛන " VIII" සඳහන් පරීක්ෂණය සමත් විය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවා ගත් නිලධාරියකු මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ. |

**9.2 සන්ධාන භාෂා විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :** වසරකට වරක් පවත්වනු ලැබේ

**9.3 එම විභාගය පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :** විභාග කොමසාරිස් ජනරාල්

**10. ශ්‍රේණි උසස් කිරීම :**

**10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.**

10.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

(vi) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

(vii) අදාළ සන්ධාන භාෂා ප්‍රවීණතාව (ඉංග්‍රීසි) ලබා ගෙන තිබීම.

(viii) ධාරිතා සංවර්ධන පාඨමාලා 01 සමත් වීම. (උප ලේඛන XI)

10.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍රය උපලේඛන "IX" හි දක්වා ඇත.

**10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.**

10.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් හෝ ලබා ගත් අධ්‍යාපනය පිළිබඳ හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වූ වසර පහ (05) ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

(iv) අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

(vi) ධාරිතා සංවර්ධන පාඨමාලා 02 සමත්වීම. (උප ලේඛණ XII)

10.2.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍රය උප ලේඛන ''X'' හි දක්වා ඇත.

සංලක්ෂය : උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**11. තනතුරුවලට පත් කිරීම :**

**11.1 සුදුසුකම් :**

| තනතුර | සුදුසුකම් |
|---|---|
| 1. අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති | 03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් I ශ්‍රේණියේ නිලධාරීන් |
| 2. ගුරු විද්‍යාල විදුහල්පති | 03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් I ශ්‍රේණියේ නිලධාරීන් |
| 3. අධ්‍යාපන විද්‍යාපීඨ උප පීඨාධිපති | 03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් I ශ්‍රේණියේ නිලධාරීන් |
| 4. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | I ශ්‍රේණියේ නිලධාරීන් |
| 5. සම්බන්ධීකරණ කථිකාචාර්ය | I ශ්‍රේණියේ නිලධාරීන් |
| 6. ගුරු විද්‍යාල නියෝජ්‍ය විදුහල්පති | II / III ශ්‍රේණියේ නිලධාරීන් |
| 7. ගුරු මධ්‍යස්ථාන කළමණාකරු | II / III ශ්‍රේණියේ නිලධාරීන් |
| 8. කථිකාචාර්ය | II / III ශ්‍රේණියේ නිලධාරීන් |

**11.2 තෝරා ගනු ලබන ක්‍රමය :**

11.2.1 ව්‍යවස්ථා සංග්‍රහයේ 11.1 වගුවේ අංක 4,5,6 සහ 7 යටතේ සඳහන් තනතුරු සඳහා පත් කිරීම් අදාළ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවය මත සිදු කරනු ඇත.

11.2.2 ව්‍යවස්ථා සංග්‍රහයේ 11.1 වගුවේ අංක 1,2 හා 3 යටතේ සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තනතුරුවලට පත් කරනු ලැබේ. (ලකුණු පරිපාටිය : යොමුව උප ලේඛන ''V'')

**12. සේවයට අදාළ කොන්දේසි :**

**12.1 ස්ථිර කිරීමේ කොන්දේසි :**

12.1.1 සේවයට බඳවා ගන්නා නවක නිලධාරීන් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන ආයතනයකදී බඳවා ගැනිමේදී දෙනු ලබන අනිවාර්ය දිශාභිමුඛ පුහුණුවට භාජනය විය යුතුය.

මෙම පුහුණුව සතුටුදායක අන්දමින් නිම කිරීමට අපොහොසත් වන නිලධාරීන් ඔවුන් විසින් රාජ්‍ය සේවයේ කලින් දැරූ තනතුරුවලට ආපසු යැවීම හෝ සේවය අවසන් කිරීම හෝ සිදු කරනු ඇත.

12.1.2 සීමිත ධාරාව යටතේ සේවයට බඳවා ගනු ලබන සෑම නිලධාරියකුම ඉහත 12.1.1 උප ඡේදයේ සඳහන් විධිවිධාන, ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල සඳහන් විධි විධානවලට යටත්ව එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකින් පසු සේවයේ ස්ථිර කරනු ලැබේ.

12.1.3 විවෘත ධාරාව යටතේ බඳවා ගනු ලබන සෑම නිලධාරියෙකුම ඉහත 12.1.1 උප ඡේදයේ සඳහන් විධිවිධාන, ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල සඳහන් විධිවිධානවලට යටත්ව වසර තුනක (03) ක පරිවාස කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

**12.2 පුහුණුව හා සංවර්ධනය :**

12.2.1 දිශාභිමුඛ පුහුණුව :

12.2.1.1 විවෘත : දිශාභිමුඛ පුහුණු කාල සීමාව මාස 6 කි. පුහුණු කාලය තුළ අධ්‍යාපනයට අදාළ ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර පුහුණු කාලය අවසානයේ පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

12.2.1.2 සීමිත : දිශාභිමුඛ පුහුණු කාල සීමාව මාස 1 කි. පුහුණු කාලය අවසානයේ පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

12.2.2 සේවයේ සෑම නිලධාරියෙකුටම අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලයට පිළිගත හැකි අදාළ විෂයය ක්ෂේත්‍රයට සම්බන්ධ ව්‍යාපෘතියක් යම් පාසලක හෝ උසස් අධ්‍යාපන ආයතනයක් ආශ්‍රිතව සම්පූර්ණ කිරීමට නියම කරනු ලැබේ.

12.2.3 අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය, අදාළ වැඩසටහන්වල අවශ්‍යතාවය හා අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලයේ නිර්දේශය මත ගුරු අධ්‍යාපනඥයින්ට වෘත්තීය වශයෙන් සුදුසුකම් ලබාගැනීමට හැකිවනු වස් විධිමත් තෝරා ගැනීමේ ක්‍රියාවලියකට යටත්ව ශිෂ්‍යත්ව/අනුයුක්ත කිරීම්/අධ්‍යයන චාරිකා ආදිය සේවයේ නිලධාරීන් සඳහා ප්‍රදානය කිරීම කළ හැකිය.

12.2.4 මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ අන්තර්ගතයට අමතරව රජය විසින් කලින් කළ තීරණය කරනු ලබන පරිදි අවශ්‍යවන ප්‍රවීණතා සහ නිපුණතාවයන්ද සියළු නිලධාරීන් ලබා ගත යුතුය.

12.2.5 ධාරිතා සංවර්ධන පාඨමාලා :

12.2.5.1 ධාරිතා සංවර්ධන පාඨමාලා 01

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III පන්තියේ නිලධාරීන් සඳහා අධ්‍යාපන ලේකම් විසින් නම් කරනු ලබන පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන උපලේඛන (XI) හි සඳහන් සති 06 ක ධාරිතා සංවර්ධන පාඨමාලාව සේවයට බැඳී වසර දහය (10)ක් සම්පූර්ණ කිරීමට ප්‍රථම සමත් විය යුතුය.

12.2.5.2 ධාරිතා සංවර්ධන පාඨමාලා 02

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II පන්තියේ නිලධාරීන් සඳහා අධ්‍යාපන ලේකම් විසින් නම් කරනු ලබන පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන උප ලේඛන (XII) හි සඳහන් සති 04 ක ධාරිතා සංවර්ධන පාඨමාලාව II ශ්‍රේණියට උසස්වීමෙන් අනතුරුව පමණක් වසර හත (07) ක් තුළ සමත් විය යුතු ය.

**12.3 වෙනත් කොන්දේසි :**

12.3.1 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි අදාළ වේ.

12.3.2 මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධානයන් 1986 අංක 30 දරන අධ්‍යාපන විද්‍යායතන පනතේ විධිවිධානයන් අභිබවා හෝ උල්ලංඝනය වන පරිදි හෝ ක්‍රියාත්මක නොවිය යුතුය.

12.3.3 සේවයේ නිලධාරීන් මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ උපලේඛන 'I' හි දක්වා ඇති තනතුරු දැරිය හැකි අතර දිවයිනේ ඕනෑම පළාතක සේවය කළ යුතුය.

12.3.4 සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේදී ඕනෑම වසරක් තුළ අදාළ විෂයය ක්ෂේත්‍රයක පුරප්පාඩු සංඛ්‍යාව ජුනි 30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

**13. අර්ථ නිරූපණ හා නිර්වචන :**

13.1 ''ව්‍යවස්ථා සංග්‍රහය'' යනු ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහය වේ.

13.2 ''සේවය'' යනු ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය වේ.

13.3 ''කොමිෂන් සභාව'' යනු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.4 ''අමාත්‍යාංශය'' යනු අධ්‍යාපන විෂයය භාර රේඛීය අමාත්‍යාංශය වේ.

13.5 ''ලේකම්වරයා'' යනු අධ්‍යාපන විෂයය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

13.6 ''ජාතික අධ්‍යාපන ආයතනය'' යනු 1985 අංක 28 දරන පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනය වේ.

13.7 ''ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය'' යනු 1986 අංක 30 දරන අධ්‍යාපන විද්‍යායතන පනතේ පිහිටුවන ලද පූර්ව සේවා ගුරු පුහුණු ආයතනයන්ය.

13.8 ''ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩල'' යනු 1986 අංක 30 දරන අධ්‍යාපන විද්‍යායතන පනතේ අර්ථ නිරූපණය කරන ලද අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලය වේ.

13.9 ''ගුරු විද්‍යාල'' යනු ගුරු පුහුණුව සඳහා පිහිටුවන ලද ගුරු විද්‍යාල වේ.

13.10 ''ගුරු මධ්‍යස්ථාන'' යනු ගුරුවරුන් සඳහා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ද ක්‍රියාකළ හැකි අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා පිහිටුවන ලද නේවාසික නොවන ආයතනයන්ය.

13.11 ''අදාළ විෂයය ක්ෂේත්‍රය'' යනු මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ උපලේඛන 'II' හි හෝ එහි සංලක්ෂය අනුව බඳවා ගැනීමට පළ කරනු ලබන ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් විෂයය ක්ෂේත්‍රයන්ගෙන් එකක් වේ.

13.12 ''සක්‍රීය සේවා කාලය'' යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

13.13 ''ක්‍රියාත්මක දිනය'' යනුවෙන් අදහස් කරනුයේ මෙම ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වේ.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතනය සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

14.1 **I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

ක්‍රියාත්මක දිනට පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ 1 පන්තියේ නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ඇත.

14.2 **II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

ක්‍රියාත්මක දිනට පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ 2-I හා 2-II පන්තියේ නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ඇත.

14.3 **III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම**

ක්‍රියාත්මක දිනට පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ 3 පන්තියේ නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ඇත.

15. **අන්තර්කාලීන විධිවිධාන :**

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර දෙක (02) ක කාලයක් දක්වා අන්තර්කාලය බලපැවැත්වේ.

15.1 **අන්තර්කාලය තුළදී III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම**

* 8.1 සංලක්ෂය අදාළ වේ.
* අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/පශ්චාත් උපාධිය ලබා ඇති විට සන්ධාන භාෂා ප්‍රවීණතාවය (ඉංග්‍රීසි) සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.
* ධාරිතා සංවර්ධන පාඨමාලා එක (01) සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

15.2 **අන්තර්කාලය තුළදී II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.**

* 8.1 සංලක්ෂය අදාළ වේ.
* ධාරිතා සංවර්ධන පාඨමාලා එක (01) හා දෙක (02) සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

16. මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

17. මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විට සේවයේ නියුතුව සිටින වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයසට එළඹ නැති නිලධරයෙකු හට ඔහු විසින් කරනු ලබන ඉල්ලීමක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ සේවයෙන් විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දිය යුතුය. එවන් සහනයක් පිරිනැමිය යුතු තරමට මෙම සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන වලින් අහිතකර බලපෑමක් එම නිලධරයාට ඇති වී ඇතැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත් වන්නේ නම් මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට අවුරුදු 03 ක් තුළ ඔහු/ඇයට එම මනාපය ප්‍රකාශ කළ හැක.

**උපලේඛනය** - I

**තනතුරු පිළිබඳ ලේඛනය**

| | |
|---|---|
| I වන ශ්‍රේණිය | අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති<br>අධ්‍යාපන විද්‍යාපීඨ උප පීඨාධිපති<br>ගුරු විද්‍යාල විදුහල්පති<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සම්බන්ධීකරණ කථිකාචාර්ය |
| II/III ශ්‍රේණිය | ගුරු විදුහල් නියෝජ්‍ය විදුහල්පති<br>ගුරු මධ්‍යස්ථාන කළමණාකරු<br>කථිකාචාර්ය |

## උපලේඛනය - II

### විෂයය ක්ෂේත්‍ර ලේඛනය - (විෂයයන්)

(අධ්‍යාපන අමාත්‍යාංශයේ අවශ්‍යතාවය පරිදි වරින්වර සංශෝධනය කළ හැකිය)

1. වෘත්තීය විෂයය

   (i) අධ්‍යාපන මූලධර්ම

   (ii) පාසල් සංවිධාන හා පන්ති කාමර කළමනාකරණය

   (iii) අධ්‍යාපන මාර්ගෝපදේශකත්වය

   (iv) අධ්‍යාපන මනෝවිද්‍යාව

   (v) අධ්‍යාපන සමාජ විද්‍යාව

   (vi) ඉගැන්වීමේ ක්‍රමය

   (vii) ඇගයීම් හා මිනුම්

2. සිංහල භාෂාව (මව්බස)
3. සිංහල භාෂාව (දෙවන බස)
4. දෙමළ භාෂාව (මව්බස)
5. දෙමළ භාෂාව (දෙවන බස)
6. ඉංග්‍රීසි
7. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
8. නැටුම්
9. නැටුම් (භාරත)
10. සංගීතය
11. සංගීතය (කර්ණාටක)
12. බටහිර සංගීතය
13. චිත්‍ර
14. නාට්‍ය හා රංග කලාව
15. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
16. ප්‍රාථමික අධ්‍යාපනය

   (i) මව්බස

   (ii) සෞන්දර්ය අධ්‍යාපනය

   (iii) ශාරීරික අධ්‍යාපනය

   (iv) විශේෂ අධ්‍යාපනය

   (v) නිර්මාණ කුසලතා

   (vi) ඉංග්‍රීසි

   (vii) ප්‍රාථමික විද්‍යාව

   (viii) ප්‍රාථමික ගණිතය

17. බුද්ධ ධර්මය
18. කතෝලික ධර්මය/ක්‍රිස්තු ධර්මය
19. හින්දු ධර්මය
20. ඉස්ලාම් ධර්මය
21. ගණිතය
22. ජීව විද්‍යාව
23. රසායන විද්‍යාව
24. භෞතික විද්‍යාව
25. යාන්ත්‍රික තාක්ෂණය
26. ඉදිකිරීම් තාක්ෂණය
27. විදුලිය හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය

**උපලේඛනය - II (සම්බන්ධිතයි)**

**විෂයය ක්ෂේත්‍ර ලේඛනය - (විෂයයන්)**

(අධ්‍යාපන අමාත්‍යාංශයේ අවශ්‍යතාවය පරිදි වරින්වර සංශෝධනය කළ හැකිය)

28. ශිල්ප කලා (මැටි ශිල්පය සහ හස්ත කර්මාන්ත)
29. පේෂ කර්ම තාක්ෂණය
30. පුරවැසි අධ්‍යාපනය
31. ඉතිහාසය
32. භූගෝල විද්‍යාව
33. පුස්තකාල හා තොරතුරු අධ්‍යයනය
34. කෘෂි විද්‍යාව
35. විශේෂ අධ්‍යාපනය
36. ගෘහ ආර්ථික විද්‍යාව
37. ප්‍රංශ භාෂාව
38. ව්‍යවසායකත්ව අධ්‍යයනය
39. කළමනාකරණ අධ්‍යයනය

**උපලේඛනය - III**

**කාර්යක්ෂමතා කඩඉම්**

1. **පළමු කාර්යක්ෂමතා කඩඉම :**

* III වන ශ්‍රේණියට පත්වී වසර (03) ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් අදාළ පරීක්ෂණය පවත්වනු ලැබේ.

* පළමු කාර්යක්ෂමතා කඩඉම පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

1.1 සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු ලකුණු 100 පැය 1 1/2

* රජයේ ආයතන සංග්‍රහයේ I, II, III, IV, V, VII, VIII, IX, XII, XIII, XIV, XXIV, XXVIII, XXX හා XXXI යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

* රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති I, III, IV, V, VI, VIII, X හා XII යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

1.2 මුදල් රෙගුලාසි ලකුණු 100 පැය 1 1/2

* රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වැනි කොටසේ I, II, V, VIII, XII හා XIV පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

1.3 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය ලකුණු 100 පැය 2

අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳ දැනුමක් අපේක්ෂා කෙරේ.

(i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (අධ්‍යාපනයේ නව මඟ)

(ii) 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව

(iii) 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු වන වාර්තාව

(iv) 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

(v) 1999 සිට ක්‍රියාත්මක වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (ප්‍රාථමික ද්විතීයක හා අ.පො.ස. (උ.පෙළ))

(vi) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත

(vii) 1986 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත
(viii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත
(ix) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත
(x) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාර්ය පනත
(xi) 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(xii) අධ්‍යාපනයට අදාළ පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති

1.4 ENGLISH LANGUAGE 100 marks 2 hrs

This is to assess the English Language Competence of the following subject areas.

- English Grammar - Tense and Number, Sentences (Simple/Compound/Complex/Compound Complex), Relative Clauses, Adjectives and Adverbs, Prepositions
- Listening and Speaking Skills - General Greetings and Introductions, Giving and getting information, Advising, Suggesting and Expressing Opinions, Telephone Skills, Interviewing Skills, Meeting
- Writing Skills - Internal modes of communication, Formal correspondence skills, Writing Descriptions/Explanations, Summery Writing skills, Report Writing skills

*සැ.යු* :- අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් 40ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. අපේක්ෂකයෙකුට එක් අවස්ථාවකදී එක් විෂයකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට පෙනී සිට සමත්විය හැකිය.

උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ඇති විට මෙම කාර්යක්ෂමතා කඩඉම යටතේ ඇති ඉංග්‍රීසි විෂයය සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ.

**(2) දෙවන කාර්යක්ෂමතා කඩඉම**

ll වන ශ්‍රේණියට උසස්වීම් ලැබ වසර තුන (03) ක් ගතවීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය. අධ්‍යාපන විද්‍යාපීඨ මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශයක් මත අධ්‍යාපන ලේකම් විසින් පිළිගනු ලබන ගුරු අධ්‍යාපනය හෝ අධ්‍යාපන කළමනාකරණය හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයක් සඳහා වචන 7000 කට නොඅඩු ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

**(3) තුන්වන කාර්යක්ෂමතා කඩඉම**

l වන ශ්‍රේණියට උසස් කිරීමෙන් වසර පහ (05) ක් ගතවීමට පෙර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ අධ්‍යාපන කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය.

ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවලට අමතරව රජය විසින් කලින්කල තීරණය කරනු ලබන පරිදි අවශ්‍යවන ප්‍රවීනතාවන් හා නිපුනතාවන් ද සියලුම නිලධාරීන් විසින් නියමිත පරිදි ලබාගත යුතුවේ.

**උපලේඛනය** - lV

**විවෘත/සීමිත තරඟ විභාගයේ විෂයය නිර්දේශය**

01. විභාගයේ නම - විවෘත/සීමිත පදනම මත ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ lll වන ශ්‍රේණියට බඳවා ගැනීම

02. විභාගය පිළිබඳ විස්තර - (i) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයෙකුට කැමති එක් භාෂාවකින් පෙනී සිටිය හැකිය.
(iii) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය | කාලය පැය 02 | ලකුණු 100 | 40 |
| අවබෝධය හා සිද්ධි අධ්‍යයනය | කාලය පැය 02 | ලකුණු 100 | 40 |
| අධ්‍යාපන මූල ධර්ම | කාලය පැය 01 | ලකුණු 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා - විභාග කොමසාරිස් ජනරාල්
04. විභාගය පවත්වනු ලබන කාල සීමාව - අවම වශයෙන් වසරකට එක් වරක්
05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය | ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත් භාවය සහ අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| අවබෝධය හා සිද්ධි අධ්‍යයනය | දෙන ලද මාතෘකාවක්/තේමාවක් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කන සහ පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව සහ නිවැරදිව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ඊට අමතරව යම් ප්‍රස්තුත ගැටළුවකදී අපේක්ෂකයා එම ගැටළුව නිරාකරණය කිරීමට යොදා ගන්නා ක්‍රමවේදයන් පරීක්ෂා කෙරේ. |
| අධ්‍යාපන මූලධර්ම | අධ්‍යාපන දර්ශනය, අධ්‍යාපන සමාජ විද්‍යාව, ගුරු භූමිකාව, අධ්‍යාපන ප්‍රතිපත්ති සහ නූතන ගැටළු, අධ්‍යාපන සැලසුම්කරණය සහ කළමණාකරණය, අධ්‍යාපන ඇගයීම්, ඉගෙනුම් ඉගැන්වීම් උපායමාර්ග, අධ්‍යාපන තාක්ෂණය සහ අධ්‍යාපන පර්යේෂණ යන ක්ෂේත්‍රවලට අදාළව අයදුම්කරුගේ අවබෝධය මෙයින් පරීක්ෂා කරනු ලැබේ. |

**උපලේඛනය - V**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 11.2.2 හි සඳහන් තනතුරුවලට පත් කිරීමේ ලකුණු දීමේ පරිපාටිය

| *ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|
| 1. සේවා පළපුරුද්ද<br>ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සෑම වසරක් සඳහා ලකුණු 5 බැගින් | 50 | |
| 2. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 12 | |
| 3. සන්ධාන භාෂා ප්‍රවීණතාවය | 06 | |
| 4. තොරතුරු සන්නිවේදන හැකියාව | 02 | 35 |
| 5. විෂයය බාහිර ක්‍රියාකාරකම් හා ජයග්‍රහණය | 20 | |
| 6. පර්යේෂණ හා ප්‍රකාශන | 05 | |
| 7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 100 | |

*සටහන*

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

2. ඉහත වගුවෙහි දක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍රය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයක් ඇතුළත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

## උපලේඛනය - Vl

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ අනුමත තනතුරු හා පැවරෙන කාර්යයන්

| අනු අංක | අනුමත තනතුරු | කාර්යයන් |
|---|---|---|
| 01 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පාලන මුදල් හා අධ්‍යයන කටයුතු මෙහෙයවීම. ''ඒ'' ශ්‍රේණියේ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු සතු වගකීම් ඉටු කිරීම. |
| 02 | ගුරු විද්‍යාල විදුහල්පති | ගුරු විද්‍යාල තුළ පරිපාලනය හා කළමණාකරනය, සංවිධානය, මෙහෙයවීම හා අධීක්ෂණය |
| 03 | අධ්‍යාපන විද්‍යාපීඨ උප පීඨාධිපති | i. පාලන හා මූල්‍ය කටයුතු සැලසුම් කිරීම, සංවිධානය මෙහෙයවීම අධීක්ෂණය ඇගයීම, අදාළ වාර්තා තබා ගැනීම හා පීඨාධිපති විසින් පවරනු ලබන රාජකාරි.<br>ii. අධ්‍යයන කටයුතු සැලසුම්කරණය, සංවිධානය, මෙහෙයවීම, අධීක්ෂණය, ඇගයීම, ගුණාත්මක තහවුරුව, ශික්ෂණලාභීන්ගේ ඇගයීම් වාර්තා පවත්වා ගෙන යාම සහ ශික්ෂණලාභීන්ගේ අවසන් ප්‍රතිඵල ලේඛන සකස් කිරීම හා පීඨාධිපති විසින් පවරනු ලබන රාජකාරි.<br>iii. අඛණ්ඩ ගුරු අධ්‍යාපන කටයුතු සැලසුම්කරණය, සංවිධානය, මෙහෙයවීම, අධීක්ෂණය, ඇගයීම් වාර්තා තබා ගැනීම හා සහතික පත්‍ර සකස් කිරීම හා පීඨාධිපති විසින් පවරනු ලබන රාජකාරි. |
| 04 | ගුරු විද්‍යාල නියෝජ්‍ය විදුහල්පති | ගුරු විද්‍යාල විදුහල්පතිගේ පරිපාලනය හා අධීක්ෂණය යටතේ ගුරු විද්‍යාල පරිපාලනයට සහයවීම. |
| 05 | සම්බන්ධීකරණ කථිකාචාර්ය | i. විද්‍යාපීඨයේ පාලන අංශය පිළිබඳ සම්බන්ධීකරණය කිරීම හා පීඨාධිපති විසින් පවරනු ලබන රාජකාරි.<br>ii. අධ්‍යාපන විද්‍යාපීඨයේ අධ්‍යයන කටයුතු සම්බන්ධීකරණය කිරීම හා පීඨාධිපති විසින් පවරනු ලබන රාජකාරි. |
| 06 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | අධ්‍යාපන විද්‍යාපීඨයේ ගුරු අභ්‍යාසලාභීන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා විෂයය සමගාමී කටයුතු, අධ්‍යයනය, ව්‍යවහාර හා සීමාවාසික අධ්‍යයන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණ හා ඇගයීම් කටයුතුවල නිරතවීම හා පීඨාධිපති/ගුරු විද්‍යාල විදුහල්පති විසින් පවරනු ලබන රාජකාරි. |
| 07 | ගුරු මධ්‍යස්ථාන කළමනාකරු | ගුරු මධ්‍යස්ථානයේ අධ්‍යාපනික හා පරිපාලන කටයුතු පිළිබඳ වගකීම් දැරීම. |
| 08 | කථිකාචාර්ය | දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරි, අධ්‍යාපන විද්‍යාපීඨයේ ගුරු අභ්‍යාසලාභීන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා විෂය සමගාමී කටයුතු අධ්‍යයනය, ව්‍යවහාර හා සීමාවාසී අධ්‍යයන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණ හා ඇගයීම් කටයුතුවල නිරතවීම හා පීඨාධිපති/ගුරු විදුහල්පති/ගුරු මධ්‍යස්ථාන කළමනාකරු විසින් පවරනු ලබන රාජකාරි. |

## උපලේඛනය - VII

**01. විශේෂ අධ්‍යාපනය**

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විශේෂ අධ්‍යාපන විෂයය සහිත පශ්චාත් උපාධිය සමග පූර්ණ කාලීනව වසර 5 ක අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ගුරු පුහුණු සහතිකය සහ අදාළ විෂයය ක්ෂේත්‍රයේ පූර්ණ කාලීනව වසර 6ක ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් හා අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි පූර්ණ කාලීනව වසර 7 ක ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(iv) විශේෂ අධ්‍යාපනය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි ගුරු පුහුණු සහතිකය සමග පූර්ණ කාලීනව වසර 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

**02. තොරතුරු තාක්ෂණය**

(i) පිළිගත් විශ්වවිද්‍යාලකින් තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ හෝ උපාධියක් ලබා තිබීම ; හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හා අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම ; හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් හෝ සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම පිළිබඳ වසර 5 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ; හෝ

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම පිළිබඳ වසර 5 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ; හෝ

(v) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක් යටතේ ලබා ගත් උපාධියක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීමේ පිළිබඳ වසර 6 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ; හෝ

(vi) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හා වසර 07 කට නොඅඩු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

**03. බටහිර සංගීතය**

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳව ලබා ගත් උපාධියක් හා වසර 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් සමග අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(iii) බටහිර සංගීතය විෂයය ක්ෂේත්‍රයෙන් ලබා ගත් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා අදාළ පුහුණුවෙන් පසු වසර 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(iv) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද අදාළ විෂයය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් හා වසර 10 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(v) පහත සඳහන් ආයතනයකින් බටහිර සංගීතය viii වන ශ්‍රේණිය ප්‍රායෝගික හා ලිඛිත පරීක්ෂණය සමත්වීම සමග වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.

a) Department of Examinations, Sri Lanka
b) Trinity College of Music, London
c) Royal School of Music, London
d) London College of Music
e) Institute of Western Music and Speech, Colombo

**04. ඉංග්‍රීසි**

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සහිතව දෙවන භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සමග වසර 6ක ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(ii) ඉංග්‍රීසි පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ඉංග්‍රීසි ගුරු පුහුණු සහතිකය සමග ගුරු පුහුණුවෙන් පසු වසර 7ට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.

**05. ශාරීරික අධ්‍යාපනය**

(i) ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් හා වසර 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ලබා ගත් ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය සමග පුහුණුවෙන් පසු වසර 6 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ධාරාවක උපාධියක් හා පිළිගත් විශ්වවිද්‍යාලයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධිය සමග වසර 6ක ශාරීරික අධ්‍යාපනය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ; හෝ

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ධාරාවක උපාධියක් සමග සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ගුරු පුහුණු සහතිකය ලබා වසර 6කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

**06. තාක්ෂණික විෂයයන්**

* ඉදිකිරීම් තාක්ෂණය
* යාන්ත්‍රික තාක්ෂණය
* කලා ශිල්ප
* විදුලි හා විද්‍යුත් තාක්ෂණය
* ගෘහ ආර්ථික විද්‍යාව

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ ලබාගත් උපාධියක් හා වසර 07 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(ii) අදාළ විෂයයෙන් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර 07 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් හා අදාළ විෂයය පිළිබඳව ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය සමග වසර 6කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද ; හෝ

(iv) අදාළ විෂයය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර 6කට නොඅඩු අදාළ විෂයය ඉගැන්වීමේ පළපුරුද්ද සමග අදාළ විෂයය ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් ඕනෑම සහතිකයක් තිබීම.

a. තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික සහතිකය

b. තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය

c. රජයේ කාර්මික විද්‍යාලයකින් හෝ බහු තාක්ෂණික ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු කාලයක් සඳහා වූ ඩිප්ලෝමා සහතිකය

d. සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් I, II හෝ III සහතිකය

e. NVQ-V මට්ටමේ තාක්ෂණික සහතිකය

උපලේඛනය - VIII

ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය

* Scheme of Evaluation : Written Examination Marks : 100 Duration : 2 hrs.

* At least 40% marks should be obtained to secure a pass in this question paper.

*Content*

English Grammar

A suitable level of proficiency on the following forms of grammar in the spoken and the written language is expected from the candidate.

- Tense and Number
- Sentences (Simple/Compound/Complex/Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

Writing Skills

The Knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Essaay Writing
- Summary writing skills
- Report writing skills
- Letter writing

Reading Skills

Candidate's ability to comprehend a printed text, infer meaning and written interpretation is expected.

- Reading and understanding the specific and general meaning of a printed text
- Reading and Interpretation (written)

උපලේඛනය IX

ආදර්ශ අයදුම් පත්‍රය

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් II ශ්‍රේණියට උසස් කිරීම**

1 කොටස

1. (අ) මුලකුරු සමග නම : ........................................................................................................මයා/මිය/මෙනවිය.

(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම : ........................................................................................................

(ඇ) නම් වෙනස් කළේ නම් මීට පෙර භාවිතා කරන ලද නම : ........................................................................................................
(නම වෙනස් කර ඇත්නම් පමණි)

2. උපන් දිනය : ........................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................................................................
4. පෞද්ගලික ලිපිනය : ........................................................................................................
5. දුරකථන/e-mail : ........................................................................................................
6. දැනට සේවය කරන ආයතනය : ........................................................................................................
7. දැනට දරන තනතුර : ........................................................................................................
8. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පත්වීම් දිනය : ........................................................................................................
9. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පත්වීම් ලිපියේ අංකය සහ දිනය : ........................................................................................................
10. පත්වීම් ස්ථිර කළ දිනය : ........................................................................................................
11. 1 වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය හා විභාග අංකය : ........................................................................................................
12. සේවයේ වසර දහය (10) ක් සම්පූර්ණ වූ දිනය : ........................................................................................................
13. උසස්වීමේ පූර්වාසන්න වසර දහය (10) තුළ පෙන්නුම් කර ඇති කාර්යය සාධන මට්ටම : ........................................................................................................

| වසර | කාර්යය සාධන මට්ටම |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

14. අනෙක් රාජ්‍ය භාෂාව සමත් වූ දිනය හෝ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වූ දිනය : ........................................................................................................
එම ලිපියේ යොමු අංකය සහ දිනය : ........................................................................................................
15. මෙම සේවයේ වැටුප් රහිත නිවාඩු ලබා ඇත/නැත. (ලබා ඇත්නම් එම දිනයන් සඳහන් කළ යුතුය.) : ........................................................................................................
16. සන්ධාන භාෂාව සමත් වූ දිනය හෝ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වූ දිනය : ........................................................................................................
එම ලිපියේ යොමු අංකය සහ දිනය : ........................................................................................................
17. ධාරිතා සංවර්ධන පාඨමාලා 1 සාර්ථකව හදාරා නිම කර ඇති දිනය : ........................................................................................................

........................................................... දින සිට ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

........................................
අයදුම්කරුගේ අත්සන

........................................
දිනය

11 කොටස

*ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)*

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ ................................................................................................................................
මයා/මිය/මෙනවියගේ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදිය.

i. ............................ දිනට වසර දහය (10) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත/නැත*.

ii. උසස්වීම පූර්වාසන්න වසර දහය (10) තුළම සාමාන්‍ය මට්ටමට හෝ ඊට වඩා ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර ඇත/නැත*.

iii. එම වසර දහය (10) තුළ අඩ වැටුප්/වැටුප් රහිත නිවාඩු ලබා නොමැත/ඇත*.

iv. එම කාලය තුළ අවවාද කිරීමක් හැර කිසිම දඬුවමකට යටත් කර නොමැත/ඇත*.

v. නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව විනය කටයුතු කිසිවක් නොමැත/ඇත*.

vi. අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන නොමැත/ඇත*.

vii. .................................................... දින සිට පත්වීම ස්ථිර කර ඇත/නැත.

viii. I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී ඇත/නැත.

ix. දෙවන භාෂාවෙන් සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇත/නැත.

x. සන්ධාන භාෂාවෙන් සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇත/නැත.

xi. ධාරිතා සංවර්ධන පාඨමාලාව 1 සම්පූර්ණ කර ඇත/නැත.

* අවශ්‍යතා සපුරා නොමැති නම් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

මෙම නිලධාරියා/නිලධාරිනිය ................................................................. දින සිට සේවයේ II ශ්‍රේණියට උසස්කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය :-.......................................................                                        ..............................................................
පීඨාධිපති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.

---

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරියා/නිලධාරිනිය .................................................................... දින සිට II ශ්‍රේණියට උසස්කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය :-.......................................................                                        ..............................................................
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන).

## උපලේඛනය X

ආදර්ශ අයදුම් පත්‍රය

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම**

1 කොටස

1. (අ) මුලකුරු සමග නම : ........................................................................ මයා/මිය/මෙනවිය
   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම : ........................................................................
   (ඇ) නම් වෙනස් කළේ නම් මීට පෙර භාවිතා කරන ලද නම : ........................................................................
   (නම වෙනස් කර ඇත්නම් පමණි)
2. උපන් දිනය : ........................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................................
4. පෞද්ගලික ලිපිනය : ........................................................................
5. දුරකථන/e-mail : ........................................................................
6. දැනට සේවය කරන ආයතනය : ........................................................................
7. දැනට දරන තනතුර : ........................................................................
8. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II ශ්‍රේණියට උසස්වීම් දිනය : ........................................................................
9. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II ශ්‍රේණියේ උසස්වීම් ලිපියේ අංකය සහ දිනය : ........................................................................
10. පත්වීම් ස්ථිර කළ දිනය : ........................................................................
11. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 සම්පූර්ණ කළ දිනය : ........................................................................
12. 11 වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය හා විභාග අංකය : ........................................................................
13. සේවයේ II ශ්‍රේණියේ වසර හත (07) ක් සම්පූර්ණ වූ දිනය : ........................................................................
14. උසස්වීමේ පූර්වාසන්න වසර හත (07) තුළ පෙන්නුම් කර ඇති කාර්යය සාධන මට්ටම : ........................................................................

| වසර | කාර්යය සාධන මට්ටම |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

15. ශ්‍රී.ලං.ගු.අ.සේ. ව්‍යවස්ථාවේ 10.2.1 (i) හි සඳහන් පශ්චාත් උපාධියේ නම සහ වලංගු දිනය : ........................................................................

........................................................ දින සිට ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

........................................
අයදුම්කරුගේ අත්සන

........................................
දිනය

**11 කොටස**

*ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)*

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන ශ්‍රේණියේ ........................................................................................................................ මයා/මිය/මෙනවියගේ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදිය.

i. ............................ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත/නැත*.

ii. උසස්වීම පූර්වාසන්න වසර හත (07) තුළම සාමාන්‍ය මට්ටමට හෝ ඊට වඩා ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර ඇත/නැත*.

iii. එම වසර හත (07) තුළ අඩ වැටුප්/වැටුප් රහිත නිවාඩු ලබා නොමැත/ඇත*.

iv. එම කාලය තුළ අවවාද කිරීමක් හැර කිසිම දඬුවමකට යටත් කර නොමැත/ඇත*.

v. නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව විනය කටයුතු කිසිවක් නොමැත/ඇත*.

vi. අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන නොමැත/ඇත*.

vii. .................................................. දින සිට පත්වීම ස්ථිර කර ඇත/නැත.

viii. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 සම්පූර්ණ කර ඇත/නැත.

ix. II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී ඇත/නැත.

x. ශ්‍රී. ලං.ගු.අ.සේ. ව්‍යවස්ථාවේ 10.2.1.(i) හි සඳහන් පශ්චාත් උපාධිය ලබාගෙන ඇත/නැත.

* අවශ්‍යතා සපුරා නොමැති නම් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

මෙම නිලධාරියා/නිලධාරිනිය ................................................................ දින සිට සේවයේ I ශ්‍රේණියට උසස්කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය :-......................................................

..............................................................
පීඨාධිපති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.

---

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරියා/නිලධාරිනිය ................................................................... දින සිට I ශ්‍රේණියට උසස්කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය :-......................................................

..............................................................
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)

## උපලේඛනය XI

### ධාරිතා සංවර්ධන පාඨමාලා 01 හි සංයුතිය

01. කළමණාකරණය
02. මුදල් රෙගුලාසි
03. සැලසුම්කරණය
04. නායකත්වය
05. අන්තර්පුද්ගල සම්බන්ධතා
06. වෘත්තීය ආචාරධර්ම
07. ඵලදායිතා ශිල්ප ක්‍රම හා ගුණාත්මකභාවය
08. ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම
09. මානව සම්පත් කළමණාකරණය
10. අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදයන්
11. විෂයය පිළිබඳ නව දැනුම
12. නව අධ්‍යාපන සංකල්ප
13. තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා e - රාජ්‍ය සේවය
14. විධායක කළමනාකරුවන් සඳහා ඉංග්‍රීසි
15. පෞර්ෂ සංවර්ධනය

## උපලේඛනය XII

### ධාරිතා සංවර්ධන පාඨමාලා 02 හි සංයුතිය

01. ගැටුම් කළමණාකරණය
02. ආපදා කළමණාකරණය
03. මනෝවිද්‍යාත්මක මූලධර්ම
04. මූල්‍ය කළමණාකරණය හා අයවැය සාරාංශ තුලනය කිරීම
05. ටෙන්ඩර් පටිපාටි හා ඊට ආනුශංගික මුදල් රෙගුලාසි
06. ආයතන සංග්‍රහයේ II කාණ්ඩය
07. තුලනාත්මක පාලන සටහන් ක්‍රමය (Balanced Score Card System)
08. අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදයන්
09. නව අධ්‍යාපන සංකල්ප
10. තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා e - රාජ්‍ය සේවය
11. විධායක කළමනාකරුවන් සඳහා ඉංග්‍රීසි
12. පෞර්ෂ සංවර්ධනය
13. වෙනස්වීම් කළමණාකරණය (Change Management)
14. ව්‍යාපාර පෙරසරි ප්‍රතිනිර්මාණය (Business Process Reenginering - BPR)

08 - 360

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.